සියලු ආගම් එකතු වී කටයුතු කළහොත්

රටට සංවර්ධනය උදාකළ හැකි වැඩපිළිවෙළක් අප සතුයි

- හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

සියලුම ආගමිකයින් සහ ජාතියකින් එකට එකතු වී කටයුතු කළහොත් රටට උදා කර ගත හැකි සංවර්ධනය සම්බන්ධයෙන් ජනතාව පුළුල් ලෙස දැනුම්වත් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටද අප කටයුතු යොදා තිබෙනවා යැයි හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය ඊයේ (11) ප්‍රකාශ කළාය.

- කොළඹ ඩී.එස්. ෆොන්සේකා මාවතේ පිහිටි විපක්ෂ නායක කාර්යාලයේදී එක්සත් ජාතික පක්ෂ ජාතික නායක හා විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා හමුවීමෙන් පසු මාධ්‍ය වෙත විශේෂ ප්‍රකාශයක් කරමින් හිටපු ජනාධිපතිනිය මේ බව පැවැසුවාය.

එහිදී අදහස් දැක්වූ හිටපු ජනාධිපතිනි සහ දකුණු ආසියානු ප්‍රතිපත්ති සහ පර්යේෂණ ආයතනයේ සභාපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය මෙසේ පැවැසුවාය.

දකුණු ආසියානු ප්‍රතිපත්ති අධ්‍යයනය ආයතනය කියන්නේ දේශපාලන සංවිධානයක් හෝ ලාභ උපයන ආයතනයක් නොව දකුණු ආසියානු රටවලට පොදුවේ බලපාන ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයකුයි.

මේ ආයතනයේ ආරම්භය සහ කාර්යභාරය වන්නේ දකුණු ආසියානු කලාපයේ මානව ගරුත්වයක් සහිතව ජීවත් විය හැකි සමාජයක් ගොඩනැඟීම සඳහා ආගමික සංහිඳියාවක් ඇති කරමින් පුරවැසියන් බලගන්වා, ජාතීන් සහ රටවල් අතර, විශ්වාසය ගොඩනැංවීම සඳහා වැදගත් වන්නා වූ ප්‍රතිපත්ති සම්පාදනයට සහය දැක්වීමයි.

ගෙවුණු අවුරුදු කිහිපය ඇතුළත දී ශ්‍රී ලංකාවේ බෞද්ධ නොවන අනෙකුත් ආගමික සිද්ධස්ථානවලට එනම් ක්‍රිස්තියානි සහ මුස්ලිම් සිද්ධස්ථානවලටත්, එම ආගමිකයින්ගේ ව්‍යාපාරික ආයතනවලටත් විවිධ කණ්ඩායම් ප්‍රහාර එල්ල කරනු අප දුටුවා. ඒ අවස්ථාවේදී දකුණු ආසියානු ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඒ සම්බන්ධයෙන් කරුණු සොයා බලා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබුවා.

මේ තත්ත්වය යටතේ ආගමික සංහිඳියාව සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අප කමිටුවක් ආරම්භ කළ අතර, ඒ කමිටුව ඔස්සේ අප වැඩකටයුතු ක්‍රියාත්මක කරමින් සිටිනවා. බෞද්ධාගමේ පාර්ශ්ව හතරේ අනුනාහිමිවරුන්, අගරදගුරුතුමන්ලා, මවිලවිවරුන් සහ හින්දු ආගමික නායකයින් ඇතුළු සමාජ නායකයින් රැසක් මේ කමිටුව නියෝජනය කරනු ලබනවා.

මේ ආගමික සංහිඳියාව ඇති කිරීම සඳහා අප කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරමින් සිටින අතර, "ආගමික සංහිඳියාවක් ගොඩනැඟීම" යන තේමාව යටතේ මේ ලියවිල්ල සකස් කළේ ඒ සාකච්ඡා අනුවයි.

එක්සත් ජාතික පක්ෂ ජාතික නායක සහ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා අප මෙසේ හමු වූයේ මේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් එතුමා දැනුම්වත් කිරීමටයි. අපේ ඉල්ලීමට අනුව අපට ඉක්මනින් වේලාවක් දී හමු වී සාකච්ඡා කිරීම ගැන රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු එක්සත් නායකත්ව මණ්ඩලයේ ප්‍රධානීන්ට අප අපේ ස්තුතිය පුද කරනවා.

මේ කාරණය සම්බන්ධයෙන් කරුණු කාරණා දැනුම්වත් කිරීමේ සාකච්ඡා සඳහා රජයෙන්ද අප මේ වන විටත් වේලාවන් ඉල්ලා තිබෙනවා. පළමුවෙන්ම මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා අප වේලාවක් ඉල්ලා සිටියේ ජනාධිපතිතුමාගෙන් වන නමුත් තවම එතුමාගෙන් පිළිතුරක්වත් ලැබී නැහැ. රජයේ මැති ඇමැතිවරුන් ගණනාවකගෙන්ද අප මේ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීම සඳහා වේලාවන් ඉල්ලා සිටි අතර, දැනට ඇමැතිවරුන් දෙතුන් දෙනෙකු අප මුණගැසීම සඳහා අපට වේලාවනදී තිබෙනවා.

ආගමික සහ ජාතික අසමගිය හේතුවෙන් රටේ ඇති විය හැකි භයානක තත්ත්වයත් සියලුම ආගමිකයින් සහ ජාතිකයින් එකට එකතු වී කටයුතු කළහොත් රටට උදාකර ගත හැකි සංවර්ධනය සම්බන්ධයෙන් ජනතාව පුළුල් ලෙස දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටද අප කටයුතු යොදා තිබෙනවා.

එහිදී අදහස් දැක්වූ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා,

ආගමික සංහිඳියාව ගොඩනැඟීම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීම සඳහා හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුතු දකුණු ආසියානු ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මගෙන් වේලාවක් ඉල්ලා සිටියා.

ඒ අනුව අප කිහිපදෙනා මේ සාකච්ඡාව මෙසේ ආරම්භ කළ අතර, පළාත් සභා මැතිවරණ කටයුතු හේතුවෙන් එක්සත් නායකත්ව මණ්ඩල සභාපති දේශබන්දු කරු ජයසූරිය මහතාට මේ අවස්ථාවට එක්වීමට නොහැකි වුණා.

අප විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කරුණු සාකච්ඡා කළේ ශ්‍රී ලංකාවේ ආගමික සංහිඳියාව ගොඩනැඟීමේ සහ ඊට අදාළ ප්‍රශ්න ගැන පමණයි. ඊට අමතරව දේශපාලන පක්ෂ ගැන තබා පළාත් සභා මැතිවරණය ගැනවත් අප කතා කළේ නැහැ.

මේ කාලය ඇතුළත දී ක්‍රිස්තියානි, මුස්ලිම් සහ හින්දු ආගමික සිද්ධස්ථානවලට එල්ල වුණු ප්‍රහාර ඒ ආගමිකයින් මුහුණදී සිටින ප්‍රශ්න සහ මේ සිද්ධීන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොවීම ගැන අප දීර්ඝ ලෙස සාකච්ඡා කළා.

එමෙන්ම රටේ බහුතරයට අයත් වන බුද්ධාගමේ මහ සංඝරත්නයට මුහුණදීමට සිදුව තිබෙන ප්‍රශ්න පිළිබඳවද අවධානය යොමු කළ යුතු බව දකුණු ආසියානු ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට මම යෝජනා කළා.

ඒ මන්ද අපේ නිකාය සහ පාර්ශ්ව පාලනය කරන මහ නා හිමිවරුන් සහ කාරක සංඝ සභාවල අධිපති කිරීමේ වැඩපිළිවෙළක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබෙන නිසයි. මහ නා හිමිවරුන්ගේ සහ කාරක සංඝ සභාවල ආධිපත්‍යය බිඳවැටුණොත් විශාල ප්‍රශ්නයක් මතු වෙනවා.

සාමාන්‍යයෙන් රාජ්‍ය අනුග්‍රහය මේ වනතුරු ලබාදී තිබුණේ මහ නා හිමිවරුන්ගේ සහ කාරක සභා කරුණු සාකච්ඡා කර සියල්ල අනුමත කර ගැනීම සඳහායි. ඒ සම්ප්‍රදායෙන් තොරව කටයුතු කරන විට සිදුවන්නේ මහ සංඝ රත්නය සහ කාරක සභාවල අඩුවීමයි. එවිට අදහස් ස්වාධීනව ප්‍රකාශ කිරීමට සහ අන්තවාදයට විරුද්ධව කතා කිරීමට තිබෙන අවස්ථා අහිමි වෙනවා. මේ උත්සාහ කරන්නේ මහ සංඝ රත්නය මත් කුඩු, කැසිනෝ සහ එනෝල් ආදියට විරුද්ධවීම වැළැක්වීමටයි.

20 වැනි ගත වර්ෂයේ සිට අප සියලු දෙනාම පොදුවේ එකඟවී ක්‍රියාත්මක කළ මේ රටේ වටිනාකම් පිළිබඳ රාමුව සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. දේශපාලන, සමාජ සහ සංස්කෘතික යන සියලු ක්ෂේත්‍ර සම්පූර්ණයෙන්ම කඩාවැටෙමින් තිබෙන බව කිව යුතුයි.

එම නිසා අප මූලිකවම කළ යුත්තේ අපේ වටිනාකම් අප යළිත් ප්‍රකාශයට පත්කර ඒ මත පදනම්ව අලුත් දේශපාලන සමාජ සහ සංස්කෘතික ක්‍රමයක් අප රටේ ඇති කළ යුතුයි. එසේ නොවුණහොත් මේ රට සම්පූර්ණයෙන්ම පිරිහීම අප කිසිවකුට වැළැක්විය නොහැකියි. අපේ රටේ වටිනාකම සහ සමාජ ක්‍රමය ගැන ලෝකයට එදා සිට තිබුණු ඒ විශාල පැහැදීම අප නැති කර ගත්තොත් අපේ රටට අනාගතයක් ඇත්තේ නැහැ.

මේ අවස්ථාවට එක්සත් ජාතික පක්ෂ මහලේකම් තිස්ස අත්තනායක, එක්සත් නායකත්ව මණ්ඩල නායක සහිකයින් වන රවී කරුණානායක, මංගල සමරවීර සහ රුවන් විජයවර්ධන, දකුණු ආසියානු ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂක සී.ඩී. කාසිලෙවිටි යන මහත්වරු ඇතුළු නියෝජිත පිරිසක් එක්ව සිටියහ.